# SLITA

## ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

### (කර්මාන්ත අමාත්‍යාංශය)

# ඇබෑර්තු

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තය සඳහා පුහුණු කිරීම්, උපදේශන සේවා, පරීක්ෂණාගාර කටයුතු, තාක්ෂණික සේවා හා තාක්ෂණික ව්‍යාපෘති හා උපදේශන සේවා සපයන රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. එහි පහත සඳහන් ඇබෑර්තුව ඇත.

**01. අධ්‍යක්ෂ (මෙහෙයුම්)**

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අපේක්ෂකයින් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කළමනාකරණය / වාණිජ / මානව සම්පත් කළමනාකරණය / නීතිය හෝ විද්‍යාව පිළිබඳ උපාධිය. **සමග**

අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (Master's) **සහ**

රාජ්‍ය සේවා, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ අවුරුදු පහළොවක (15) පළපුරුද්ද.

**අභ්‍යන්තර අපේක්ෂකයින් : (පහත 1 හෝ 2)**

01. ඉහත බාහිර අපේක්ෂකයින්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
02. ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයේ කළමනාකාර කාණ්ඩයේ (MM 1-1) I ශ්‍රේණියේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවාවක් සම්පූර්ණ කිරීම.

**වයස :** අවුරුදු 35 නොඅඩු හා අවුරුදු 55 නොවැඩි. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාල නොවේ.

**වැටුප් පරිමාණය :** (HM 1-3-2016) රු. 86,865/- 15 x 2,270/- - 120,915/-

රජයේ අනුමත දීමනා හා අනෙකුත් ව්‍යවස්ථාපිත දීමනා සිදු කරනු ලබයි.

අදාල අමතර අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද ඔබට වාසියක් ලබා දෙයි.

ඉහත තනතුරු සඳහා ඔබගේ අයදුම්පත ජීව දත්ත තොරතුරු සමග විස්තර සහිතව 2023 මාර්තු මස 15 වන දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල් වෙත ආයතනයට සම්බන්ධ නැති දෙදෙනෙකුගේ නම් සහිතව (non-related referees) ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අදාල තනතුර සඳහන් කරන්න. (සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසු අයදුම්පත් පමණක් කැඳවනු ලබන අතර, අවසාන තීරණය පාලක මණ්ඩලය සතුය)

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය,**
**අංක 02, කඳවල වත්ත, සේනාධිපති ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත,**
**රත්මලාන.**
**දු. අංකය : 0112632406, ෆැක්ස් අංකය : 0112636337,**
**වෙබ් : www.slita.lk**